# ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය හා මූලාශ්‍රය භාවිතය

- වටරක්ගොඩ සුමන හිමි

## ප්‍රවේශය

ඓතිහාසික පර්යේෂණ යනුවෙන් වර්ගීකරණයකට ලක් කොට ඇති පර්යේෂණ ක්‍රමවේදය කුමක් ද යන්නත් එම පර්යේෂණ සිදුකරන්නේ කවර ආකාරයකට ද යන්නත් පිළිබඳව මෙහි දී මුලින් ම අවධානයට ලක් කෙරේ. විශේෂයෙන් ම පර්යේෂණ ක්ෂේත්‍රයේ දී ඓතිහාසික පර්යේෂණයේ ඇති උපයෝගීතාව පිළිබඳව විශ්ලේෂණයක් ද සිදු කෙරෙයි. ඉන් අනතුරුව ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයක මූලිකම අංග ලක්ෂණය ලෙස සලකන මූලාශ්‍රය භාවිතය සාකච්ඡාවට ගැනේ. එහි දී මූලාශ්‍රය හඳුනාගැනීම, වර්ගීකරණය කිරීම, විචාරශීලීව විමර්ශනයට ලක්කිරීම සහ විශේෂයෙන්ම ඓතිහාසික පර්යේෂණවල දී මූලාශ්‍රය භාවිත කරන අන්දම පිළිබඳව සාකච්ඡාවට ගැනීම ද සිදුකරනු ලබයි.

## ඓතිහාසික පර්යේෂණයක් යනු කුමක් ද?

දැනුම ලබාගැනීම සඳහා සිදුකරනු ලබන අධ්‍යාපන පර්යේෂණ මූලික වශයෙන් ක්‍රමවේද දෙකක් යටතේ වර්ග කළ හැකිය. එනම්,

අරමුණු අනුව වර්ග කිරීම

ආකෘතිය අනුව වර්ග කිරීම වශයෙනි.

මෙසේ මූලිකව දෙකොටසකට බෙදෙන පර්යේෂණ ක්‍රමවේද මූලික පර්යේෂණ, ව්‍යවහාරික පර්යේෂණ, ඇගයීම් පර්යේෂණ, සංවිධානාත්මක පර්යේෂණ, ක්‍රියාකාරී පර්යේෂණ යන පර්යේෂණ ප්‍රවර්ග අරමුණු අනුව වර්ග කිරීම් යටතට ද ඓතිහාසික පර්යේෂණ, විස්තරාත්මක පර්යේෂණ, සහසම්බන්ධතා පර්යේෂණ, හේතු සංසන්දනාත්මක පර්යේෂණ, පරීක්ෂණාත්මක පර්යේෂණ යන ප්‍රවර්ග යන් ආකෘතිය අනුව වර්ග කිරීම් යටතට අයත් වේ (ලියනගේ, 1990; 22).

උක්ත තොරතුරු දැක්වීම අනුව වැටහෙනුයේ ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය ආකෘතිය අනුව පර්යේෂණ වර්ග කිරීමෙහි ගොන්නට අයත් වන බවය. මෙකී ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය බොහෝ දුරට භාවිත කෙරෙනුයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා විෂය ධාරාවන් පිළිබඳව අධ්‍යයනය කරන අවස්ථාවන්හි දී ය. ''මෙම පර්යේෂණ ක්‍රමය මගින් අතීත සිදුවීම් වර්තමානයේ දි අධ්‍යයනය කළ හැකිය. වර්තමානයේ ඉතිරි වී ඇති ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික වාර්තා පදනම් කරගෙන අතීත සිදුවීම් පර්යේෂණයට ලක් කිරීම ඓතිහාසික පර්යේෂණය නම් වේ'' (සේනාධීර සහ වනසිංහ, 2013; 61). මෙකී නිර්වචනයට අනුව ද හුදෙක් ම ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය යනු ඉතිහාසය අධ්‍යයනය කිරීම ලෙසට ද අර්ථකථනය කළ හැකිය. එසේම අතීත සිදුවීම් පමණක් නොවේ අතීතයේ රචනා කරන ලද කෘති තුළින් ගම්‍යමාන කෙරෙන සාහිත්‍යය, දේශපාලනය, භූගෝලය, ආගම, සමාජය ආදි වූ සකලවිධ පරාසයන් පරීක්ෂණයට බඳුන් කිරීම ඓතිහාසික පර්යේෂණ යන්නට ඇතුළත් වේ.

ඉතිහාසය විෂයට අදාළව මෙම ප්‍රස්තුතය සාකච්ඡා කිරීමෙන් ඉතා පහසුවෙන් ඓතිහාසික පර්යේෂණයක් යනු කුමක්දැයි වටහාගත හැකිය. කාලයේ මානයට අනුව මානව ක්‍රියාකාරකම් භූගෝලීය අවකාශයට සම්බන්ධ කළ විට ඓතිහාසික අවකාශය නිර්මාණය වේ. ඉතිහාසඥයන් විසින් පර්යේෂණයට බඳුන් කරනු ලබන්නේ එකී ඓතිහාසික අවකාශයේ තෝරාගනු ලැබූ කොටසක් පමණි. එම තෝරාගනු ලැබූ කොටස, අතීතය යනුවෙන් සමස්ත යටගියාවම හඳුන්වන විට ඉතිහාසය යනු එකී යටගියාවෙන් ඓතිහාසික මානව ක්‍රියාකාරකම් සිදු වූ එක් කොටසක් පමණි. පුද්ගල ඥානයට ඥානනය වන ආකාරයට සමස්ත යටගියාවම අධ්‍යයනය කිරීම කිසිලෙසකින්වත් සිදු කළ නොහැක්කකි. එබැවින් ඉතිහාසඥයා යත්න දැරිය යුත්තේ සහ යත්න දරන්නේ එකී සමස්තයෙන් පුද්ගල අභිවර්ධනයට අතිශය ඉවහල් වන මානව ක්‍රියාකාරීත්වය සනිටුහන් වූ කොටසේ අධ්‍යයනයෙහි නිරත වීමටය.

ශබ්දකෝෂ විග්‍රහයන්ට අනුව ඉතිහාසය යන්න අර්ථ ගන්වා ඇත්තේ පුද්ගලයන්, ජාතීන්, ආයතන, විෂයන් ආදියේ ප්‍රභවය හා වර්ධනය පිළිබඳව කරනු ලබන ක්‍රමවත් අධ්‍යයනයක් යනුවෙනි,

මෙම අර්ථකථනයට අනුවත් ඉතිහාසය විද්‍යාවක් බව දක්වන කායිස්ට්ලේටත් ඉතිහාසඥයෙකුගේ වගකීම ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීම බව දක්වන කූල්ටත් අනුව අතීතය පිළිබඳ තොරතුරු ශාස්ත්‍රීයව අධ්‍යයනය කිරීම, ඉදිරිපත් කිරීම සහ අර්ථකථනය කිරීම ඓතිහාසික ක්‍රමවේදය තුළින් අර්ථගැන්වෙන බව පැහැදිලිය (Kaestle, 1900;37-Koul,1993;386).

මෙකී කරුණුවලට අමතරව ඓතිහාසික ක්‍රමවේදය කුමක් ද? යන පැනයට සාර්ථක පිළිතුරු ලෝක ප්‍රකට ඉතිහාසඥයන්ගේ අදහස් තවදුරටත් විමසීමෙන් මනාව පැහැදිලි කරගත හැකිය. පැරණි සිද්ධීන්වල ආලෝකයත් වර්තමාන තත්ත්වය අවබෝධ කරගැනීමත් එම දැනුම් පදනම් කරගෙන අනාගතය පිළිබඳව යම්කිසි තත්ත්වයක් ප්‍රකාශ කිරීමත් ඓතිහාසික පර්යේෂණ තුළින් කෙරෙන බව බෙස්ට් නමැති වියතා පවසා ඇත (ජයසූරිය,1994;32). මේ ප්‍රකාශයෙන් පැහැදිලි වනුයේ ඓතිහාසික සිද්ධීන් මත වර්තමානය අවබෝධ කරගැනීම ඓතිහාසික පර්යේෂණ ක්‍රියාවලිය වන බවයි. එසේම, ෆ්‍රැන්කෙල් හා වොලන් යන ඉතිහාසඥයෝ ඓතිහාසික පර්යේෂණවලින් ක්‍රමානුකූලව එක් රැස් කරන ලද දත්ත ඇගයීමට භාජනය කර ඓතිහාසික සිද්ධි හා ක්‍රියාවලින් විස්තර කිරීමත් ඒ පිළිබඳව අවබෝධය ලබාදීමත් සිදුකරන බව බව ප්‍රකාශ කළහ. කාන් නැමැති ඉතිහාසඥයා පෙන්වා දුන්නේ ඓතිහාසික ක්‍රමය ඓතිහාසික කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්නේ වර්තමාන සිදුවීම් අන්‍යෝන්‍ය සබඳතාවයකින් යුතුව අධ්‍යයනය කිරීමේ ක්‍රමයක් වන හෙයින් බවයි. කාන්ගේ අදහසට සමානව අදහසක් ඉදිරිපත් කරන ලද වියතෙක් වශයෙන් ඇන්ඩර්සන් හඳුන්වාදිය හැකිය. ඔහු ප්‍රකාශ කළේ ඓතිහාසික පර්යේෂණයක් යනු අතීත සිද්ධියක් ගැන අවධාරණය කරමින් කරන පර්යේෂණයක් බවත් එය පවතින කරුණු රැසක් තියුණු ලෙස අවධානයට ලක් කරමින් වත්මනෙහි උනන්දුවක් දක්වන ප්‍රශ්නයක් නිරාකරණය කිරීමක් බවත්ය.

මෙකී ශාස්ත්‍රඥයන්ට අමතරව ඓතිහාසික පර්යේෂණ යනු කුමක්දැයි අදහස් දක්වා ඇති පෙරදිග වියතුයන් ලෙස සිධූ හා ශ්‍රී වාස්තව පෙන්වා දිය හැකිය. සිධූ ප්‍රකාශ කළේ ඓතිහාසික ගැටලු අධ්‍යයනය සඳහා විද්‍යාත්මක ක්‍රමය ප්‍රායෝගිකව යොදා ගැනීම

ඓතිහාසික ක්‍රමවේදය බවයි (Sidhu,1992;94). ශ්‍රී වාස්තව පැවසුවේ ඓතිහාසික පර්යේෂණ යනු වලංගු මූලාශ්‍රය සාක්ෂි ලෙස ගෙන අතීත ස්ථාන ද්‍රව්‍යයක සංවර්ධනය හා අත්දැකීම් පිළිබඳව කරනු ලබන නිර්මාණාත්මක සොයා බැලීමක් බවයි. මේ අකාරයෙන් ඓතිහාසික පර්යේෂණ පිළිබඳව වියතුන් දක්වා ඇති අදහස් පර්යේෂණ ක්‍රමවේදය නමැති කෘතියේ දී සිල්වි සේනාධීර සහ ශාමින්ද වනසිංහ යන පර්යේෂකයන් විසින් ද සංක්ෂිප්ත වශයෙන් අවධානය යොමු කොට ඇති බව දක්නට ලැබේ (සේනාධීර සහ වනසිංහ, 2013;64-66).

**ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයේ අරමුණ හා උපයෝගිතාව**

උක්ත ශාස්ත්‍රඥයන් ප්‍රකාශ කර ඇති සියලු අදහස් විමර්ශනය තුළ පැහැදිලි වනුයේ ඓතිහාසික පර්යේෂණයේ ප්‍රධාන අරමුණ අතීත සිද්ධීන් පිළිබඳ නිවැරදි හැදෑරීම මගින් පර්යේෂකයන් ජීවත්වන කාලපරාසය සම්බන්ධව පැහැදිලි අවබෝධයක් ඇති කර ගැනීම වන බවයි. එපමණක්ම නොවේ ලෝකය වඩා යහපත් ස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ අභිප්‍රායෙන් වර්තමානය පරාවර්තනය කරන සාක්ෂ්‍ය ලෙස ඉතිහාසය යොදාගනිමින් ඒ ඒ පරිසර තත්ත්වයන්ට අනුරූපී සකලවිධ සමාජ වෙනස්වීම් හඳුනාගෙන අනාගතය වෙත ගමන්ගන්නා මාවත් නිර්මාණය කරවීම ද ඓතිහාසික පර්යේෂණයන් තුළින් අරමුණු කරන බව ද පෙන්වා දිය හැකිය.

විද්‍යාත්මක පර්යේෂණ ආදී වෙනත් පර්යේෂණ ක්‍රමයන්හි දි මෙන් ම ඓතිහාසික පර්යේෂණ ක්‍රමයේ දි ද අනුගමනය කරනු ලබන්නේ එකී පර්යේෂණයන්ට සමාන පියවරයන් ම ය. එහි දි භාවිත කරගනු ලබන පොදු පියවර පද්ධතිය ලෙස ''ගැටලුව හඳුනාගැනීම, කල්පිත පිහිටුවා ගැනීම, මූලාශ්‍රය සාක්ෂි සොයාගැනීම, තොරතුරු වාර්තා කිරීම, තොරතුරු හා මූලාශ්‍රය ඇගයීම, වාර්තාව ඉදිරිපත් කිරීම'' යනාදිය හඳුනාගත හැකිය. (සේනාධීර සහ වනසිංහ, 2013; 51). මෙසේ සිදුකරනු ලබන ඓතිහාසික පර්යේෂණ තුළින් ලද හැකි සාර්ථක ප්‍රතිඵල මෙන් ම, අසාර්ථක ප්‍රතිඵල ද දැකගත හැකිය. ඓතිහාසික ක්‍රමවේදය හරහා මතුකර ගත හැකි ප්‍රබලතා ලෙස,

- අතීත සිද්ධියක් නැවත වර්තමානයේදී ප්‍රතිනිර්මාණය කළ හැකිවීම.
- අතීත සිද්ධියක් වර්තමානයට බලපාන ආකාරය සොයාබැලිය හැකි වීම.
- ඓතිහාසික කරුණු අනාගතයට බලපාන ආකාරය පර්යේෂණය කළහැකි වීම. (උදාඃ- 1815 උඩරට ගිවිසුම)
- විනාශ වීගෙන යන ප්‍රාථමික මූලාශ්‍රයන් තාක්ෂණික ක්‍රම මාර්ගයෙන් සංරක්‍ෂණය කළ හැකිවීම. (උදාඃ- ඉපැරණි ග්‍රන්ථ මෘදු පිටපත් බවට පත් කිරීම)
- අතීතයේ සිදු වූ ඇතැම් සිද්ධිවලට බලපෑ හේතු සොයා බලා අනාගතයේ යළිත් එවැනි දෑ සිදු නොවීමට යෝජනා නිර්දේශ ඉදිරිපත් කිරීම. (උදාඃ- තිස්වසරක් බලපැවැත් වූ යුද්ධයක් ශ්‍රී ලංකාව් ඇතිවීමට හේතු සොයා බලා නැවත එවැන්නක් ඇති නොවීමට ගතයුතු ක්‍රියාමාර්ග යෝජනා කිරීම.)
- අතීතය පිළිබඳ නොදන්නා කරුණු මතුකර ගතහැකි වීම. යනාදි කාරණාවන් පෙන්වා දිය හැකිය.

ඓතිහාසික පර්යේෂණයේ දක්නට ලැබෙන ප්‍රබලම දුර්වලතාව ලෙස චන්ද්‍රා ජයසූරිය පෙන්වා දෙන්නේ සාමාන්‍යකරණය හා පෙර කීම අසීරු වීමයි. එසේම, බොහෝ විචාරකයන් පෙන්වා දෙන්නේ ඓතිහාසික පර්යේෂණ කිසිම අවස්ථාවක සම්පූර්ණ නොවන බවයි. බෙස්ට් හා කාන් පෙන්වා දෙන ආකාරයට ඓතිහාසික ක්‍රමවේදයන්හි දැක්වෙන දුර්වලතා ලෙස ලබාගන්නා තොරතුරු සාමාන්‍යකරණය කළ නොහැකි වීම, අන් අයගේ වාර්තා මත රඳා පැවතීම, සාක්ෂි විද්‍යාත්මක නොවීම, අසම්පූර්ණ සාක්ෂි ලැබීම නිසා පර්යේෂකයාට හිස්තැන් පිරවීමට සිදුවීම, විචල්‍යය පාලනය කළ නොහැකි වීම යනාදිය පෙන්වා දිය හැකිය (Best & Khan, 1993;88-89).

මෙම තොරතුරු දැක්වීම් හමුවේ පැහැදිලි වනුයේ ඓතිහාසික ඓතිහාසික ක්‍රමවේදය අනුව අතීත සිද්ධි තුළින් වර්තමාන ගැටලුවලට විසඳුම් පෙන්වීමේ අරමුණින් හෝ ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීමේ අරමුණින් විද්‍යාත්මක ක්‍රමය ඔස්සේ සිදුකරනු ලබන අධ්‍යයනයක් බවයි. මෙම ඓතිහාසික ක්‍රමවේදය තුළ විවිධාකාර වූ දුර්වලතා දක්නට ලැබුණ ද එය භාවිතයෙන් ලද හැකි සාර්ථකභාවය හේතුවෙන්

බොහෝ පර්යේෂකයන් වර්තමානයේ මෙම ක්‍රමවේදය ස්වකීය අධ්‍යයන කාර්යාවලි සඳහා ඉවහල් කරගන්නා අයුරු දැකගත හැකිය.

## ඓතිහාසික පර්යේෂණයක මූලිකාංගය

වෙනත් පර්යේෂණ ක්‍රමවේදවලට සාපේක්ෂව ඓතිහාසික පර්යේෂණවල වැඩි අවධානයක් මූලාශ්‍රය සම්බන්ධයෙන් ලබා දෙනු ලබයි. පර්යේෂණයේ ගැටලුව තෝරාගැනීමේ දී සහ උපන්‍යාස නැතහොත් කල්පිත ගොඩනැගීමේ දී මූලාශ්‍රය මූලික වේ. ගැටලුව සාකච්ඡා කිරීමටත් කල්පිතය ගොඩනැගීමටත් ප්‍රමාණවත් මූලාශ්‍රය පවතින්නේ ද යන්න සොයා බැලීම මෙහි දී මුලින්ම සිදුකරයි. ඉන් පසුව මූලාශ්‍රය හඳුනාගනිමින් ඒවායේ සඳහන් තොරතුරු නව අවබෝධයක් ජනිත වන අකාරයෙන් විශ්ලේෂණය කරමින් අධ්‍යයනයට බඳුන් කෙරේ. නිගමනය ලබා දීම සම්පූර්ණයෙන් ම මූලාශ්‍රය මත පදනම් වන බැවින් ඓතිහාසික පර්යේෂණයක වැදගත්ම අංගය ලෙස මූලාශය පිළිබඳව සාකච්ඡාව පුළුල්ව සිදුකළ යුතුය.

## මූලාශ්‍රය හඳුනා ගැනීම

මූලාශ්‍රය යන්නෙහි ඉංග්‍රීසි වදන 'Sources' යන්නයි. මෙම වදනට අරුත් සපයන ඉංග්‍රීසි සිංහල මහා ශබ්දකෝෂය ''උපත, මූල, උල්පත ප්‍රභවය, ප්‍රමුඛස්ථානය, මූල හේතුව, මූලකරණය, උපාදාන කාරණය, මාර්ග, ආරංචි මාර්ගය'' (ගම්ලත්,2008:85) යනාදී අරුත් සපයා ඇත. එසේ ම, සිංහල භාෂාවේ මූල ආශ්‍රය යන පද දෙකේ සංයෝගයෙන් මූලාශ්‍රය යන පදය නිෂ්පාදනය වී ඇති බැව් පෙනේ. ඒ අනුව, මෙයින් මූලය ඇසුරු කිරීම, භාවිතයට ගැනීම මූලාශ්‍රය යන්නෙන් අරුත් ගැන්වෙන බව පෙනේ. අතීත සිදුවීම් සහ සාධක පිළිබඳව තොරතුරු සමහර වර්ගයේ සාක්ෂි තුළින් හෙළි වෙයි. එවැනි සාක්ෂි මූලාශ්‍රය නම් වේ. ඉතිහාස විෂය ධාරාවට මෙන්ම අන් සියලු විෂයන්ට ද මූලාශ්‍රය හෙවත් මූලයන් අවශ්‍ය වේ. ඒ ඒ විෂයන්ගේ වෛෂයික කාරණා ගොඩනැගෙනුයේ එම මූලාශ්‍රය සොයා ගැනීම මතය. මන්ද සොයනු ලබන ඓතිහාසික කරුණු පිළිබඳව තොරතුරු පර්යේෂකයා වෙත ප්‍රසාරණය කරනු ලබන්නේ මූලාශ්‍රය මගින් වීම නිසාවෙනි. ඒ නිසා මූලාශ්‍රයවලින් තොරව ඓතිහාසික පර්යේෂණයක්

සිදු කිරීම පාදමක් නොමැති ගෘහයක් නිර්මාණය කළා සේ වනු ඇත. එහෙයින් මූලාශ්‍රය අතිශය වැදගත් වන බව පැහැදිලිය.

## මූලාශ්‍රය ප්‍රවර්ග

මූලාශ්‍රය විචාරශීලීව අධ්‍යයනයට බඳුන් කිරීමට මත්තෙන් මූලාශ්‍රයවල දක්නට ලැබෙන ප්‍රවර්ග පිළිබඳව අධීක්ෂණය වැදගත් වනු ඇත. මූලාශ්‍රය ප්‍රවර්ග කිරිමේදී හමුවන ප්‍රධාන බේදීම් දෙකකි. එනම්

01. සාහිත්‍ය මූලාශ්‍රය 02. පුරාවිද්‍යා මූලාශ්‍රය

යනුවෙනි. සාහිත්‍ය මූලාශ්‍රය යනුවෙන් හඳුන්වන්නේ යම්කිසි ඓතිහාසික කාරණාවක් පිළිබඳව තොරතුරු අන්තර්ගත කර ඇති පොත්පත් ආදියයි. සාහිත්‍ය මූලාශ්‍රයෝ ද කොටස් දෙකකි. ඒ

01. ප්‍රාථමික මූලාශ්‍රය 02. ද්විතීයික මූලාශ්‍රය

යනුවෙනි. ප්‍රාථමික මූලාශ්‍රය යනු මුල් සිද්ධි පිළිබඳව ඉතිරි වී ඇති කොටස්ය. මේවා පර්යේෂකයාට ඍජු ලෙසින්ම නිරීක්ෂණය කිරීමට හැකි භෞතික වස්තූන් වේ (ජයසූරිය, 2017;45). ප්‍රාථමික මූලාශ්‍රය යනු මොනවාදැයි මෙලෙසින් අධ්‍යයනය කරන කල පෙනී යන්නේ තෙවැනි පාර්ශ්වයක මැදිහත් වීමෙන් තොරව තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍රය ප්‍රාථමික මූලාශ්‍රය වන බවයි. මෙසේ අර්ථකථනයට ලක් කෙරෙන ප්‍රාථමික මූලාශ්‍රය ද විවිධ විභේදනයන් යටතේ දැක්විය හැකිය.

### පෞද්ගලික වාර්තා

දිනපොත්, ජීවිත කතා ලිපි, අන්තිම කැමති පත්‍ර, කතා, ලියුම්, පොත්, දිවුරුම් ප්‍රකාශ, දැන්වීම්, අත් පත්‍රිකා

### රාජකාරි ලේඛන

ආඥාපනත්, නඩු තීන්දු, රජය හෝ ප්‍රාදේශීය ආයතන මගින් පනවන නීති, කොන්දේසි, සංඛ්‍යා ලේඛන, මූල්‍ය වාර්තා, රැස්වීම්

වාර්තා, අධ්‍යාපනික වාර්තා, කොමිසම් වාර්තා, වාර්ෂික වාර්තා, අයවැය ලේඛන ආදිය.

**වාචික වාර්තා, සාම්ප්‍රදායික අංග**

කටකතා, ජනකතා, ජීවිත කතා, පවුල් පිළිබඳ කතා, වාචිකව දෙනු ලබන සාක්ෂි, ගුණානුස්මරණ හා සම්මුඛ සාකච්ඡා ආදිය.

**පිංතූරමය වාර්තා හා තාක්ෂණික වාර්තා**

ඡායාරූප, චිත්‍ර, කාසි, ප්‍රතිමා, සම්මුඛ සාකච්ඡා, රූස්වීම් කථා ආදියේ පටිගත කිරීම්, වීඩියෝ දර්ශන

**නටබුන් හා නෂ්ටාවශේෂ**

පොසිල, උපකරණ, ආයුධ, ඇඳුම්, ගොඩනැගිලි, ගෘහ උපකරණ ආදිය.

යනාදි වශයෙනි. පුරාවිද්‍යා මූලාශ්‍රය, මූලාශ්‍රය ප්‍රවර්ගයන්හි ප්‍රධානම ධාරාවක් වෙයි. එක් අතකින් බලන කල්හි උක්ත විභේදනවලට අනුව පුරාවිද්‍යා මූලාශ්‍රයන් ද අන්තර්ගත වන්නේ ප්‍රාථමික මූලාශ්‍රය ගණයට ය. මන්ද, අතීතයේ මානවයාගේ ක්‍රියාකාරකම් හරහා නිර්මාණිතව විවිධාකාර වූ පාරිසරික සහ මානව බලපෑම්වලට ලක්ව වර්තමානය දක්වා පැවත එමින් තෙවැන්නකුගේ මැදිහත්වීමකින් තොරව තොරතුරු ලබාදෙන බැවිනි. පුරාවිද්‍යා මූලාශ්‍රය ගණයට අයත් වන මූලාශ්‍රය ලෙස ගොඩනැගිලි නෂ්ටාවශේෂ, අභිලේඛන, චිත්‍ර, මූර්ති, කැටයම්, වාරිමාර්ග නෂ්ටාවශේෂ ආදී ලෙස වර්ගීකරණය කළ හැකිය. මෙහි ගොඩනැගිලි නෂ්ටාවශේෂ යන කොටස නැවතත් ආගමික ගොඩනැගිලි නටඹුන්, වෘත්තීමය මධ්‍යස්ථාන, රාජකීය මාළිගා නටඹුන්, ප්‍රාදේශිය ප්‍රභූ නිවාස නටඹුන්, යුධමය වශයෙන් ඉදිකරන ලද බලකොටු නටඹුන් වශයෙන් ද කොටස් කළ හැකිය. ආගමික ගොඩනැගිලි නටඹුන් යළිත්, චෛත්‍ය නටඹුන්, බෝධිඝර නටඹුන්, උපෝසථඝර නටඹුන්, පටිමාඝර නටඹුන්, වාහල්කඩ නටඹුන්, සංඝාරාම නටඹුන්, පිරිවෙන් නටඹුන්, දේවාල නටඹුන් ආදී වශයෙන් වර්ග කළ හැකිය.

පුරාවිද්‍යා මූලාශ්‍රය ගණයට අයත් වන අභිලේඛන පාර්ශ්වය තුළ ද විවිධ විභජනයන් දැකගත හැකිය. ඒවා නම්, සෙල්ලිපි, සන්නස්, පුස්කොළ ආදී වශයෙනි. මෙහි සෙල්ලිපි යන කොටස ''සෙල්ලිපි, ගිරිලිපි, ටැම්ලිපි, පුවරු ලිපි, වෙනත් ලිපි වශයෙන් හා ගුහා ලිපි, පර්වත ලිපි, ස්තම්භ ලිපි, පරදර ලිපි කියා ද සමහරු බෙදති' '(අමරවංශ හිමි, 1969:10). මෙපමණක්ම නොවේ. මෙකී අභිලේඛන භාෂාව අනුව ද රචිත ශෛලිය අනුව ද කාලපරාසය අනුව ද තවතවත් කොටස්වලට බෙදා දැක්විය හැකිය.

යම් කාරණාවක් පිළිබඳ තොරතුරු විමර්ශනයේ දී ඒ හා සම්බන්ධ මූලික ම තොරතුරු ප්‍රාථමික මූලාශ්‍රයට අයත්වන බැව් පූර්ව කරුණු දැක්වීම් තුළින් පැහැදිලි වේ. එසේම, එකී කාරණා පිළිබඳව තොරතුරු අනාවරණය කරනු ලබන වෙනත් පුද්ගලයන්ගේ වාර්තා හා සාක්ෂි ද්විතීයික මූලාශ්‍රය ලෙසින් අර්ථකථනය කළ හැකිය. ඉන්දීය ඉතිහාසඥ ශ්‍රී වාස්තව පෙන්වා දෙන්නේ අතීත සිද්ධි හා අංග පිළිබඳව විවිධ පුද්ගලයන් ඉදිරිපත් කරන සටහන් හා වාර්තා ද්විතීයික මූලාශ්‍රයන් වන බවයි. (Srivasthava, 1994:193) බොහෝ විට ද්විතීයික මූලාශ්‍රය නිර්මාණය වන්නේ ප්‍රාථමික මූලාශ්‍රය පදනම් කරගනිමිනි. මෙහිදී තුන්වැන්නෙකුගේ මැදිහත්වීම සිදුවන නිසා ද්විතියික මූලාශ්‍රය පරිශීලනයේදී පරෙස්සම් විය යුතුය. එසේම එම මූලාශ්‍රවල වලංගුතාව හා විශ්වසනීයත්වය පිළිබඳ ගැටලු ද මතු වේ.

මෙම ප්‍රවර්ගයට අමතරව මූලාශ්‍රය කාලය අනුව, රට හෝ ප්‍රදේශය අනුව, සුවිශේෂී සිදුවීම් අනුව, ප්‍රසිද්ධ පුද්ගලයන් අනුව, යම් යම් ක්ෂේත්‍ර අනුව යනුවෙන් ද ප්‍රවර්ගකරණයකට ලක් කළ හැකිය. දේශීය මූලාශ්‍රය, විදේශීය, දේශාටන වාර්තා, රාජ්‍ය ලේඛන, රාජ්‍ය නොවන ලේඛන යනුවෙන් ද තවත් ආකාරයක වර්ග කිරීමක් පෙන්වා දිය හැකිය. නූතනයේ තාක්ෂණයේ දියුණුවත් සමගින් යම් ඓතිහාසික කාරණාවක් පිළිබඳ තොරතුරු විමර්ශනයේ දි භාවිතා කළ හැකි මූලාශ්‍රය ගණනාවක් බිහි වී තිබෙනු හඳුනාගත හැකිය. ඒ

01. පරිගණක මෘදුකාංග 02. අන්තර්ජාලය

යනාදී වශයෙනි. අන්තර්ජාලය ප්‍රමුඛ මූලාශ්‍රයක් ලෙස ශීර්ෂගත කළ ද ඒ තුළින් ද හමුවන තවත් බොහෝ මූලාශ්‍රට දැකගත හැකිය. ඒවා වෙබ් අඩවි - World Wilde Web, ඊ පොත් - ebook, ඊ සඟරා- emagazine, ඊ පුවත්පත් - enewspaper, ඊ පුස්තකාල - elibrary, ඊ මිතුරන් - efriends, විවිධ සංවිධාන - Organization යනාදි වශයෙන් කාණ්ඩගත කර පෙන්වා දිය හැකිය. මෙලෙසින් ඓතිහාසික ක්‍රමවේදය යටතේ ඉතිහාසගත කාරණාවක් අධ්‍යයනය කරනු ලබන විටදී භාවිතයට ගනු ලබන මූලාශ්‍රය විවිධ අංශ ඔස්සේ ප්‍රවර්ග ගත කළ හැකි බව පෙන්වා දිය හැකිය.

**මූලාශ්‍රය කුමට ද?**

මෙම පැනයට ලබාදිය හැකි කෙටි සහ සරලම පිළිතුර වන්නේ අතීතයේ තොරතුරු වර්තමානයේ තහවුරු කිරීම සඳහා යන්නය. එහෙත්, මූලාශ්‍රය අවශ්‍ය වන්නේ කුමකට ද? යන ගැටලුව ගැඹුරින් අධ්‍යයනය කරන විට උක්ත සරල පිළිතුරට වඩා අරුත් ඉන් ගම්‍යමාන වන බව පැහැදිලි වේ. ඉතිහාසඥයෙකුට ඓතිහාසික සිද්ධි ප්‍රතිනිර්මාණය කිරීම මූලාශ්‍රවලින් වියුක්තව සිදුකළ නොහැකි වනු ඇත. එනිසා අතීත සිද්ධි පිළිබඳ තොරතුරු අනාවරණය කරගනිමින් එහි සිදුවීම් වර්තමානය තුළ ප්‍රතිනිර්මාණය කිරීම උදෙසා මූලාශ්‍රය අවශ්‍ය වේ.

අතීත සිදුවීම් මූලාශ්‍රය හරහා නිරීක්ෂණය කිරිම තුළින් අතීතය ප්‍රතිබිම්බනය කරන්නේ ඉතිහාසඥයා විසිනි. එම ප්‍රතිබිම්බනය වර්තමානය තුළ දෘශ්‍යමාන වනුයේ ඉතිහාසඥයාගේ සැරසිලි හෙවත් අර්ථකථන ලබාදීම තුළිනි. එබැවින් එසේ ලබාදෙන අර්ථකථනය නිරවද්‍ය ද යන වග තහවුරු කරගනු පිණිස මූලාශ්‍රය ආශ්‍රය නිතැතින්ම අවශ්‍ය වේ. ඓතිහාසික කරුණු කාරණාවන්ට අර්ථකථන ලබා දී එය යථාර්ථයක් බවට පත් කරන්නේ ඉතිහාසඥයා විසිනි. ඉතිහාසඥයා විසින් තහවුරු කරනු ලබන කරුණු සැබැවටම සත්‍ය ඒවා වන බව සහතික වීම සඳහා ඉදිරිපත් කරනු ලබන සාක්ෂියක් වන්නේ මූලාශ්‍රයය.

එපමණක්ම නොවේ. ඕනෑම ප්‍රපංචයක් පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමේ දී ඉදිරිපත් කරන්නාට එම කරුණු පිළිබඳව විශ්වාසයක් සේම, එම කරුණු ග්‍රහණය කරගැනීමට බලා සිටින පුද්ගලයන්ට ද එම කරුණු ගැන විශ්වාසයක් ඇතිවිය යුතුය. එබඳු විශ්වාසයක් ඇතිවනුයේ ඉදිරිපත් කරන කරුණේ තහවුරුව උදෙසා භාවිත කරන මූලාශ්‍රයවල ශක්තිමත් භාවය අනුවය.

**ශුද්ධමය මූලාශ්‍රය වන්දනය**

ඉතිහාසකරණයේ ආරම්භකයා ලෙස සැලකෙන හෙරඩෝටස් නැමැති ග්‍රීක-රෝම යුගයේ විසූ ඉතිහාසඥයා ප්‍රකාශ කරන ලද්දේ ඓතිහාසික කරුණු ඉදිරිපත් කිරීමේ දී එම කරුණු පිළිබඳව විමසා බලා අපක්ෂපාතීව කරුණු ඉදිරිපත් කළ යුතු බවයි. ඉනික්බිතිව දේවධර්මවදි යුගයේදි ඉතිහාසය දෙවියන්ගේ නිර්මිතයක් ලෙස ගොඩනැගුණු අතර මානව ශාස්ත්‍ර වර්ධිත යුගයේ යළිත් කරුණුවලට ඇති වැදගත්කම ඉස්මතු වේ. රෙනේ ඩෙකාට්ස් වැනි වියතුන් විසින් විද්‍යාත්මක ක්‍රමය හඳුන්වාදීමෙන් අනතුරුව ඉතිහාසයට අර්ථකථනයන් සැපයූ ඉතිහාසයන් ප්‍රකාශ කළේ ඉතිහාසය අතීතයේ සත්‍යය බවත්, එම සත්‍ය සොයා යා හැක්කේ මූලාශ්‍රය හරහා බවත්ය.

විද්‍යානුකූල ක්‍රමවේදයට පසුව ඉදිරිපත් වන යථානුභූති ගුරුකුලයේ ද දැඩි ස්ථාවරය වී තිබුණේ ඉතිහාසය සැබෑවටම දත හැක්කේ මූලාශ්‍රය හරහා පමණක් වන බවයි. යථානුභූති ගුරුකුලයේ නිර්ණායකයන්ට අනුව ඓතිහාසික තත්ත්ව විග්‍රහ කළ දාර්ශනිකයන් පෙන්වා දුන්නේ මූලාශ්‍රය යනු අතීතයේ සත්‍යය ගැබ්ව ඇති රන්කරඬු වශයෙනි. මේ හරහා සිදුවූයේ ඉතිහාසය නැමැති මහදෙවොලේ ඉතිහාසඥයන්ගේ නිරන්තර වන්දනාවට බඳුන් වන මහාර්ඝ පූජා වස්තූන් බවට මූලාශ්‍රය පත්වීමයි. මේ නිසාවෙන් ඉතිහාසඥයෝ මූලාශ්‍රයවල ගැත්තන් වෙමින් තමන්ට අවැසි ඓතිහාසික කාරණා විග්‍රහයට නිරන්තරව බහුතර මූලාශ්‍රය සංඛ්‍යාවක සරණ පතා අයදින්නට වූහ. ''දහනවවන සියවසසේ කරුණු පූජාවාදය, ලේඛන පූජාවාදයකින් සම්පූර්ණ කර යුක්ති සහගත කෙරිණි. ලේඛන වනාහි කරුණු නැමැති දෙවොලේ දේව අණ නිදන් කොට තිබෙන කරඬුය. බැතිමත් ඉතිහාසඥයා දෝත මුදුනේ බැඳ ඒවා වෙත ඇදී

ඒවා ගරුසරුව තොස කළේය. යමක් ලේඛනවල දුටුවහොත් එය සත්‍යයක්ම විය'' (කා, 1973:10).

දහඅටවන සියවස හා දහනවවන සියවස් මුල ආරම්භ වී සංවර්ධනයට පත්වන මූලාශ්‍රය ශුද්ධ වස්තූන් ලෙසින් සලකන ලද යුගය මූලාශ්‍රය පූජනීයත්වය දක්වා ඔසවා තබනු ලබයි. පූර්ව පෙළ ගැසුම් හමුවේ ඉතිහාසඥයන් මූලාශ්‍රය වන්දිත අයුරු කදිමට පැහැදිලි වේ. එහෙත් විසිවන සියවසේ මධ්‍යභාගය හා අගභාගය වන විට ක්‍රමිකව මූලාශ්‍රය වන්දනාවෙන් ඉතිහාසඥයන් ඉවත් වන අයුරු දැකගත හැකි වේ. ඉක්බිතිව ඇරඹෙන්නේ ඉතිහාස විෂය ක්ෂේත්‍රයේ නවමු යුගයකි.

## මූලාශ්‍රය විචාරශීලීව බැලීම

''ඉතිහාසය ගැන කරුණු නිරායාසයෙන් ම සරල ප්‍රභින්න හා දැනගත හැකි එමෙන් ම එකතු කළ විට ඒ තුළ අතීතයක් ඇතුළත් වන තොරතුරු සම්ප්‍රදායකි'' (Elton,1967:86) යනුවෙන් Practice of history නම් ග්‍රන්ථයේ දී ජී.ආර්. එල්ටන් නම් ඉතිහාසඥයා පෙන්වා දුන්නේය. මේ වාක්‍ය කාණ්ඩය හරහා එල්ටන් පෙන්වා දෙනු ලැබුවේ වියුක්ත සිදුවීම් සමුදායක සංයෝජනය තුළින් අතීතයක් හෙවත් ඓතිහාසික කථාවක් නිර්මාණය වන බවය. ඓතිහාසික සංසිද්ධි එකම සංදර්භයක් තුළම ගොනු වී නොපවතී. එම නිසා ඉතිහාසය ගොඩනැංවීමට නම් තැන තැන ඇති ඓතිහාසික සංසිද්ධි එකම ධාරාවක් යටතට ගොනු කළ යුතුය. එසේ ගොනු කිරීමේදී භාවිතයට ගැනෙනුයේ මූලාශ්‍රය.

පූර්ව මාතෘකාගත කරුණු දැක්වීම් තුළ මූලාශ්‍රය යනු කුමක්ද? යන්නත් මූලාශ්‍රයේ කාර්යභාර්යය කුමක්ද? යන්නත් සාකච්ඡා කොට ඇති බැවින් මෙහි දී සිදුකරනුයේ ඉතිහාසයේ ගොඩනැගුමට ඉවහල් වන මූලාශ්‍රය තුළ දක්නට ලැබෙන ගුණයන් පිළිබඳව විමසීමය. විද්‍යාත්මක ක්‍රමය ජනිත යුගයේ සහ යථානුභූති ගුරුකුලය ස්ථාපිත යුගයේ වන්දනීය වූ ශුද්ධ වස්තු ලෙසින් හැඳින්වූ මූලාශ්‍රය පිළිබඳව ආකල්ප ක්‍රමිකව වෙනස් වීමට පටන් ගන්නේ පශ්චාත් ව්‍යුහවාදී ගුරුකුලයේ නැඟ ඒමත් සමගිනි. භෞතිකමය වශයෙන් විසිවන

සියවසේ මිනිසා අධිසංවර්ධනයට ලක්වීමත් සමගින් මානව ආකල්ප හා සංකල්ප ද විපරිවර්තනයකට ලක්වන්නට විය. එම විපරිවර්තනීය ආකල්ප ඉතිහාස විෂයට ද බලපෑම් කරන්නට වූයේ කෙනෙකු කී පමණින් මූලාශ්‍රයක සඳහන් වූ පමණින් යම් ඓතිහාසික කාරණාවක් සම්බන්ධව කරුණු ගොන්නක් තිබූ පමණින් යමක් ඉතිහාසය වන්නේ කෙසේදැයි යන පැනය පැන නඟින්නට විය.

මෙසේ පැන නැඟි ගැටලුවට විසඳුම් ලෙසින් ඉතිහාසඥයන් ඉදිරිපත් කළේ විචාරශීලීව මූලාශ්‍රය පරිශීලනය කිරීමේ මාවතයි. ඒ අනුව තවදුරටත් මූලාශ්‍රය සර්වතෝභද්‍ර නොවීය. සර්වාකාරයෙන් පාරිශුද්ධ නොවීය. ඉතිහාසය නැමැති ස්වර්ණමය දෙවොලේ මාණික්‍යමය කරඬුව නොවීය. ඉතිහාසඥයන් මූලාශ්‍රය විදාරණය කර ඒ තුළ ඇති ඓතිහාසිකමය සත්‍ය එළියට ඇදගැනීම සඳහා නොයෙක් ආකාර විමර්ශනශීලී ක්‍රමවේද ආරම්භ කරන්නට විය. මේ තත්ත්වය යටතේ මූලාශ්‍රය යන්නට විවිධ නිර්ණායක ඉදිරිපත් වන අයුරු හඳුනාගත හැකි වෙයි. ඒ අනුව, මූලාශ්‍රය යනු කිසිවිටකත් අතීතය නොවන බවටත් මූලාශ්‍රය වනාහි ඉතිහාසයේම අමුද්‍රව්‍යයක් බවටත් කරුණු ඉදිරිපත් වන්නට විය. සමස්ත යටගියාවේ තෝරාගත් කොටසක් අධ්‍යයනයට බඳුන් කරනු ලබන කල්හි වුවද මූලාශ්‍රය හරහා තොරතුරු විද්‍යාමාන කරනුයේ ඉතා අල්ප ප්‍රමාණයකි. එම නිසා එම අල්ප ප්‍රමාණය කිසිදු ලෙසකින් අතීතය විය නොහැකිය. යම් ප්‍රතිඵලයක් විද්‍යාමාන වන්නේ එක් හේතුවක ක්‍රියාකාරීත්වය හරහා පමණක් නොවේ. එකී ප්‍රතිඵලය වනාහි හේතු සන්තතියක උද්දීපනයකි. එහෙයින් මූලාශ්‍රය යනු ඉතිහාසය සනාථ කරගැනීම උදෙසා භාවිතාවට යොදාගත හැකි එක් අමුද්‍රව්‍ය කොටසක් පමණි.

**ඉතිහාසඥයා සහ මූලාශ්‍රය භාවිතය**

ඉතිහාස සංකථන ක්‍රියාවලිය තුළ ඉතිහාසඥයාට විශාල කාර්යභාරයක් පැවරෙන බව නොකිවමනාය. අතීත දත්ත විශ්ලේෂණය තුළ එකී සංදර්භයේ යථාර්ථය වර්තමානය තුළ ප්‍රතිබිම්බගත කිරීමේ මහාර්ඝ කර්තව්‍යයේ වැඩි බර ඔසවන ඉතිහාසඥයා කිසිම අවස්ථාවක මූලාශ්‍රය මත ම පදනම් නොවිය යුතුය. මූලාශ්‍රය යනු එක් පාර්ශ්වයක් විසින් දැන හෝ නොදැන ඉතිරි කරන ලද

සාක්ෂි වන බැවින් මූලාශ්‍රය මත ම අධ්‍යයනයන්හි නිරත වුවහොත් මතුවන්නේ එක් මානව කොට්ඨාසයක ඉතිහාසයක් පමණි. ඒ තුළ ඉතිහාසයේ තවත් බොහෝ කාරණාවන් ඓතිහාසිකමය වශයෙන් තව තවත් ඓතිහාසිකමය තත්ත්වයකට පත්වේ. එසේ ඉතිහාසය තුළ ඓතිහාසික කරුණු බොහොමයකගේ සැගවීම නවතාලීම සඳහා මූලාශ්‍රය මත ම පමණක් පදනම් වීමේ ක්‍රමයට නැවතීමේ තිත තැබිය යුතුය. අනාදිමත් කාලයක මානව ක්‍රියාකාරකම් පිළිබඳව තොරතුරු යම් ආකාරයකට හෝ අනාවරණය කරන්නේ මූලාශ්‍රය බැවින් ඉතිහාසය ගොඩනැංවීමේදී මූලාශ්‍රය මත පදනම් නොවී අන් කවරක් මත පදනම් විය යුතුදැයි යනුවෙන් ගැටලුවක් පැනනැගිය හැකිය. මෙය සාධාරණ ගැටලුවකි. එහෙත්, එකී සාධාරණ ගැටලුව තුළින් පැනනගින අනෙක් සාධාරණ ගැටලුව නම්, එකී මූලාශ්‍රය අතීතය පිළිබඳව පරම පවිත්‍ර තොරතුරු ලබා දෙන්නේ ද? යන්නයි. විමසුම් සහිතව අධ්‍යයනය කරන කල අවබෝධ වන්නේ එය එසේ නොවන බවයි. ඇතැම් විට මූලාශ්‍රයක් යනු ඒක පුද්ගල නිර්මිතයකි. නැතහොත් පුද්ගල සමවායක නිර්මිතයකි. ඒ නිසා ඒ තුළ ගැබ්ව ඇත්තේ එම මූලාශ්‍රය නිර්මාපකයන් විසින් විහිදවීමට බලාපොරොත්තු වන ලද ස්වකීය චින්තන ක්‍රියාවලිය පමණකි. එබැවින් මූලාශ්‍රය නිර්මාපක අදහස පමණක් නිර්මල ඉතිහාසය වන්නේයැයි තහවුරු කරන්නේ කෙසේද?

එපමණක් නොව මූලාශ්‍රයක් මුණගැසුණ පමණින්ම එය ඉතිහාසයයැයි ඒ තුළ තොරතුරු භාවිතයට ගැන්ම නුසුදුසුය. එහි මූලය පිළිබඳව තතු විත්ති සොයායම විචාරශීලී මූලාශ්‍රය අධ්‍යයනය තුළ අනිවාර්ය අංගයකි. යම් මූලාශ්‍රයක් ඉතිහාසය තුළ කිසි ලෙසකින් හෝ ඕපපාතික වස්තුවක් විය නොහැකිය. මූලාශ්‍රයට ද ඒ හා බැඳි ඉතිහාසයක් ඇත. මුලාශ්‍ර භාවිත කිරීමට මත්තෙන් එහි ඉතිහාසය අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුත්තකි. එසේ මූලාශ්‍රයක ඉතිහාසය අධ්‍යයනය කරන අතරම පරිශීලනය කරනා මූලාශ්‍රය පිළිබඳව ඇගයීමක් ලබාදීමට ද අතිශය වැදගත් වේ. ගොඩනගන ඉතිහාසයක් වේ නම් එයට නියම වටිනාකමක් ලැබෙනුයේ මූලාශ්‍රය පරිශීලනය කරන තැනැත්තා එයට ලබාදෙන ඇගයුම්ශීලීත්වයේ ප්‍රමාණයට මිස සඳහන් කරුණු මත පමණක් නොවේ.

මූලාශ්‍රය කාලයා විසින් අවිඥානිකව ම පිටත් කොට ඇත. සෑම පිටපතක ම එය ලියූ ලේඛකයා සහ කාලය පිළිබඳව ඉඟි සපයා ඇත. ඒවායෙහි සඳහන් කරුණු අපට කිසිවිටකත් බැහැර කළ නොහැකිය. එම කරුණු අපගේ මතකයේ කිඳා බසී මේ උද්ධෘත කිරීම තුළින් ද ඉස්මතු කෙරෙන්නේ අවිඥානික මූලාශ්‍රය සටහන් තුළ දක්නට ලැබෙන ඉඟි හරහා මූලාශ්‍රයේ ඉතිහාසය අධ්‍යයනය කිරිම වැදගත් වන බවයි. මූලාශ්‍රයෙහි තොරතුරු මතකයේ කිඳා බසින්නේ පාරම්පරික මානවයාගේ නොවෙනස් ගුණයක් ලෙසින් පැවත එන තමාගේ අතීතය පිළිබඳ සෙවීමේ කුතුහලයට සාධාරණත්වය ලබාදිමට නම්, මූලාශ්‍රය තුළ සඳහන් කරුණු විචාරශීලීව උක්ත කරුණු යටතේ පරිශීලනයට ලක් කිරීමට සිදු වෙයි.

ඉතිහාසඥයන් විචාරශීලීව මූලාශ්‍රය පරිශිලනය කිරීමේ තවත් එක් ක්‍රමවේදයක් ලෙස මූලාශ්‍රය වෙතින් ප්‍රශ්න විමසීමේ ක්‍රියාවලිය පෙන්වා දිය හැකිය. සාමාන්‍යයෙන් ප්‍රායෝගික ජීවිතයේ දී ද ගැටලුකාරි තත්ත්වයන් වෙතින් මිදීම උදෙසා භාවිත කරන ප්‍රතිඵලදායී ක්‍රමයක් ලෙසින් ද මෙම ප්‍රශ්න විමසීමේ ක්‍රියාවලියට හඳුන්වාදිය හැකිය. ප්‍රාථමික වේවා, ද්විතීයික වේවා යම් මූලාශ්‍රයකින් එක හා සමාන ප්‍රශ්න ඉතිහාසඥයන් විසින් විමසනු දැකගත හැකිය. එසේ විමසන ප්‍රධාන ප්‍රශ්න හයකි.

ඒ කවුද? (Who?), කොහේ ද? (Where?), මොකක් ද?

(What?), කවදා ද? (When?), කොහොම ද? (How?),

ඇයි? (Why?)

(https://www.historyonthenet.com, 02/07/2019)

යනාදී වශයෙනි. ඇතැම් විට වැදගත් වනුයේ ඉතිහාසඥයකු මූලාශ්‍රයක් මුණගැසුණු විට අසනු ලබන ප්‍රශ්නවලින් කිහිපයකි. එසේ සෑම මූලාශ්‍රයක් සම්බන්ධයෙන්ම මෙම ප්‍රශ්න නොවිමසිය හැකිය.

කවුද? (Who?)

එය හැදුවේ කවුද? එය භාවිත කළේ කවුද? පින්තූරයේ සිටින්නේ කවුද? ඒ තුළින් ප්‍රසාරණය කරන්නේ කාගේ මතකයන් ද?

කොහේ ද? (Where?)

එය ඇත්තේ කොහේ ද? එය තිබුණේ කොහේ ද? එය හැදුවේ කොහේදී ද? එය භාවිත කළේ කොහේදී ද?

මොකක් ද? (What?).

එය මොකක්ද? එය කුමක් සඳහාද? එය අර්ථවත් කරන්නේ කුමක්ද? එය භාවිතා කළේ කුමටද? එය පෙන්වන්නේ කුමක්ද?

කවදා ද? (When?)

එය හැදුවේ කවදාද? එය භාවිත කළේ කවදාද? එය පෙන්වන්නේ කුමන කාලයක්ද?

කොහොම ද? (How?)

එය හැදුවේ කොහොමද? එය භාවිත කළේ කොහොමද? එය නොනැසී පවතින්නේ කොහොමද?

ඇයි? (Why?)

එය හැදුවේ ඇයි? එය භාවිත කළේ ඇයි? එය නොනැසී පවතින්නේ ඇයි?

මෙලෙසින් මූලාශ්‍රය විමසුමට භාජනය කිරීම තුළින් සැබවින්ම බොහෝදුරට ඓතිහාසික සත්‍යයට ළඟාවිය හැකි බව අවබෝධ කරගත හැකිය. ලංකා විශ්වවිද්‍යාලයේ ඉතිහාසය දෙවැනි කාණ්ඩයේදී මූලාශ්‍රය පිළිබඳව හැඳින්වීමක යෙදෙන ලක්ෂ්මන්. සු. පෙරේරා මහතා ''මූලාශ්‍රයෝ නම් ඉතිහාසය ලිවීමේදී ඉවහල් කරනු ලබන මූලයෝ ය. මේ මූලාශ්‍රය නොතිබුණේ නම් අතීතය පිළිබඳව වාර්තාවක් හෝ සාක්ෂියක් හෝ සඳහනක් නැතිවනු නිසැකය. අප අතීතය දෙස බලන්නේ මේ මූලාශ්‍රයන් නැමැති කවුළුවලින් ය. ඒ කාලවල ඉතිහාසඥයින් විසින් පිළියෙල කරගනු ලැබූ ඉතිහාසය වනාහි මේ මූලාශ්‍රය මගින් අතීතය දෙස බැලීමට ඔවුන් දැරූ වෑයමේ ප්‍රතිඵලයකි''

යනුවෙන් පෙන්වා දී ඇත. (රායි,1972:146) ලක්ෂ්මන් ප්‍රකාශ කරන ආකාරයට මූලාශ්‍රය විරහිතව අතීතය දර්ශනය කළ නොහැකිය. මෙය යථානුභූති ගුරුකුලයේ ද මතවාදය විය. මෙතුමා පවසන ආකාරයට මූලාශ්‍රය නැමැති කවුළුවලින් පමණක් අතීතය දැකගත නොහැකිය.

කවුළුවකින් බලන කල්හි පෙනෙන්නේ සීමාසහිත තොරතුරු ප්‍රමාණයක් පමණි. අපට නිවැරදිව ඉතිහාසය ග්‍රහණය කරගැනීමට නම් එක්කෝ කවුළු විශාල ප්‍රමාණයක් විවර කරගත යුතුය. නැතහොත්, සැම දිශාවක්ම නිරීක්ෂණය කළ හැකි පරිදි මූලාශ්‍රය නැමැති ගෘහයේ කවුළුවලින් අතීතය දෙස නොබලා එළිමහනකට පැමිණිය යුතුය. එසේ එළිමහනකට පැමිණ මූලාශ්‍රය නැමැති කණ්ණාඩි කුට්ටමේ හිර නොවී නිදහසේ අතීතය දෙස බැලිය යුතුය. එවිට නිවැරදි නිරීක්ෂණයක් හරහා සැබෑ අතීතය අනාවරණය කරගත හැකිවනු ඇත.

බැරැක් ලෝ නැමැති ඉතිහාසඥයා පෙන්වා දෙන ආකාරයට අතුරුදහන් වූ පරම්පරාවලට අයත් ඉතිහාසඥයන්ගේ ද රචකයින්ගේ ද වංසකතාකරුවන්ගේ ද මළ අතින් අතීතයේ රටාව වෙනසකට ඉඩ නොතබා නිර්ණය කර ඇත. මෙහි බැරැක් ලෝ පෙන්වා දෙන වෙනසකට ඉඩ නොතැබීම යන්න කුමක්දැයි ගැටලු සහගතය. කිසිදු ඉතිහාසඥයෙකුට අතීතයේ රටාව වෙනසකට ඉඩ නොතබා තීරණය කළ නොහැකි වනු ඇත. ඇතැම් විට අතීත රටාව නිවැරදි මූලාශ්‍රය මත සටහන්ව තිබීමට ද ඇතැම් විට නොතිබීමටද හැකිය. සත්‍යතාව පසක් කරගත හැක්කේ පූර්වෝක්තාකාරයේ ප්‍රශ්න විචාරීම හරහා කරනු ලබන විචාරශීලී අධ්‍යයනය තුළිනි. ෆේඩ්න් වයිට් වැනි ඉතිහාසඥයන් පෙන්වා දෙන්නේ මූලාශ්‍රය ඉතිහාස සංකථනයේම කොටසක් බවයි. ඒ අනුව, මූලාශ්‍රය යනු ඓතිහාසික කාරණාවන්ට ඉහළින් ඇති යමක් නොව, ඓතිහාසික කාරණාවන්හිම කොටසක් බව පැහැදිලිය. එබැවින් විචාරශීලීව මූලාශ්‍රය අධ්‍යයනයේදී එකී ඓතිහාසික කාරණා ගොන්නෙන් මූලාශ්‍රය හඳුනා ගනිමින් එය ඉතිහාසයට බද්ධ වී ඇත්තේ කෙසේදැයි අධ්‍යයනය කළ යුතුය.

පශ්චාත් ව්‍යුහවාදයට අනුව මූලාශ්‍රය යනු අතීතය පිළිබඳ සංඥා ලබාදෙන ඕනෑම මූලයකි. මෙකී නිර්වචනයට අනුව සලකා බලන කල අතීතය පිළිබඳ සංඥා විහිදුවන මූලාශ්‍රය බහුලය. කැණීමකදී

හමුවන කුඩා වළං කැබැල්ලකින් වුව ද බොහෝ සංඥා නිකුත් වන බව හඳුනාගත හැකිය. එබැවින් මූලාශ්‍රය ඉතා සියුම්ව අධ්‍යයනයකට බඳුන් කිරීම සිදු කළ යුතුය. එමගින් පශ්චාත් ව්‍යුහවාදීන් බලාපොරොත්තු වන්නට ඇත්තේ දිගුකාලයක් ඉතිහාසය විෂය ක්ෂේත්‍රයේ අධිපති බලය ඉසිලූ මූලාශ්‍රයයන්හි අසීමිත බලය අභියෝගයට ලක් කිරීම

වන්නට ඇත. පූර්වයෙන් දක්වන ලද ලෙසට ම එක් මූලයකින් ප්‍රසාරණය කෙරෙන සංඥා බහුවිධ විය හැකිය. ඕනෑම මූලයක් නිපදවන්නේ මානව ක්‍රියාකාරීත්වය හරහා වන නිසා එම මානව ක්‍රියාකාරීත්වයට බලපාන වියුක්ත සාධක බොහෝ ප්‍රමාණයක් වේ. එකී සාධක කවරාකාරදැයි යන්න පිළිබඳව නිරවුල් අවබෝධයකින් තොරව ප්‍රසාරිත සංඥා නිවැරදිව අවබෝධයට අපහසුය.

යම් මූලාශ්‍රයකින් නිකුත් කරන සංඥා බලගැන්වෙන්නේ නැතහොත් ජීවය ලබන්නේ ඉතිහාසඥයෙකුගේ මැදිහත්වීම සිදුවීමෙන් අනතුරුවය. නිරන්තරව විහිදෙමින් පවතින සංඥා ඉතිහාසඥයා විසින් ග්‍රහණය කරනු ලබන ආකාරය මෙහිදි අතිශයින්ම වැදගත් වේ. සංඥා ලබාදීමත්, ඒවා ලබාගැනීමත් යන්න සජීවි ක්‍රියාවලියකි. එම ක්‍රියාවලිය තුළත් බොහෝ ප්‍රතිඵල දායක වන්නේ සංඥා ලබාගන්නා ආකාරය අනුවය. සංඥාව වර්තමානයට ප්‍රවර්තනය කර ගන්නා ඉතිහාසඥයා නිසාවෙන් මෙහිදී ඉතිහාසඥයාගේ කාර්යභාරය ද පුළුල් පරාසයකට විහිදේ. ඒ පිළිබඳව වෙනම ම අධ්‍යයනය කළ යුතුය. මූලාශ්‍රය අතීත ක්‍රියාවලියක් පිළිබඳව තොරතුරු විහිදුවන්නේ එක්තරා ශෛලියකට හෙවත් කේත ක්‍රමයකට අනුවය. එම සංඥා නිර්මාණය වී ඇත්තේ මූලාශ්‍රය නිර්මාපකයා, එහි සටහන්, ආර්ථික, සංස්කෘතික, දේශපාලන පසුබිම හා එය නිර්මාණය කරන මොහොතේ තත්ත්වයන්ට අනුකූල වන ආකාරයෙනි. එනිසා නිතැතින්ම මූලාශ්‍රය වෙනස් වන විට ලබාදෙන සංඥාවන් බහුල ලෙසින් වෙනස්වීම්වලට බඳුන් වේ. මෙසේ ලබාදෙන සංඥා කිසිවිටකත් ලබාදෙන ආකාරයටම ග්‍රහණය කර ගැනීම ඉතිහාසඥයන් විසින් සිදු නොකරනු ලබයි. ඉතිහාසඥයා, ප්‍රසාරිත සංඥාවන්ගෙන් තමන්ට අවශ්‍ය සංඥාවන් පමණක් ලබාගෙන තමාට අවශ්‍ය ලෙස විකේතනය කරයි. එනිසා කිසිවිටක ඉතිහාසඥයන් දෙදෙනෙකුගේ සංඥා භාවිතයෙන් ගම්‍ය කෙරෙන ඉතිහාස කතිකාව එකක් වන්නේ නැත. ග්‍රෝෂේ නැමැති ඉතිහාසඥයාට අනුව සෑම

ඉතිහාසඥයෙකු ම තත්කාලීන ඉතිහාසයකි. මූලාශ්‍රය තුළ විහිදෙන සංඥා කියවන ඉතිහාසඥයාගේ ක්‍රියාවලිය දෙස බැලීමේදී එම කරුණ සත්‍යයක් බව වටහා ගත හැකිය. ඉතිහාසඥයා සංඥා කියවනුයේ තත්කාලීන උවමනාවන් මත හා තමන්ට ඇවැසි ලෙස වීම සෑම ඉතිහාසයක්ම වර්තමාන ඉතිහාසයක් වීමට හේතුවයි. ඒ අනුව සෑම අතීත කාරණාවක්ම අප්‍රාණික වූවක් නොව, නිරන්තරයෙන්ව ජීව වායුම පිඹින ලදුව ආශ්වාස ප්‍රශ්වාස කරමින් ස්ඵන්දිත තත්ත්වයෙන් පසුවන ඒවාය. මේ නිසා සංඥා කියවීම නැතහොත් මූලාශ්‍රය කියවීම ඉතාමත් විචාරශීලීව සිදු කිරීම කළ යුතුව ඇත. එම විචාරය මූලාශ්‍රයේ මූලයෝ, ලබාදෙන සංඥා, ලබාදෙන ආකාරය, ලබාගන්නා ආකාරය යන අංශ සතර ඔස්සේ සිදු කළ විට අවැසි ඉතිහාසකරණය තුළ ගැබ්ව ඇති යථාර්ථය මැනවින් ග්‍රහණය කරගත හැකිය.

**සමාලෝචනය**

යම් ප්‍රස්තුතයකට අදාළව පර්යේෂණයක නිරතවීමේ දී ප්‍රධානව ම මූලාශ්‍රය වශයෙන් භාවිතයට ගැනෙන්නේ පොත් පත් ආදි වූ ලේඛනමය වශයෙන් රචනා කොට ඇති යම් මාධ්‍යයක් නම් එම පර්යේෂණ ක්‍රමය ඓතිහාසික පර්යේෂණ නමින් හඳුන්වන බව උක්ත අධ්‍යයනයන් තුළින් මැනවින් තහවුරු වේ. මෙකී පර්යේෂණ ක්‍රමය දැනුම ලබාගැනීමේ ක්‍රියාවලියේ දී කෙබඳු උපයෝගීතාවක් දක්වන්නේ ද යන්න පිළිබඳව මූලික වශයෙන් සාකච්ඡා කොට ඇත. අනතුරුව ඓතිහාසික පර්යේෂණ ක්‍රමයේ දී ප්‍රධාන වශයෙන්ම භාවිතයට ගනුලබන 'මූලාශ්‍රය' සම්බන්ධයෙන් පුළුල් පරාසයක තොරතුරු අධ්‍යයනය කිරීම සිදු කෙරිණි. එහි දී මූලාශ්‍රයක් හඳුනාගැනීම, එය කියවීම, ස්වකීය පර්යේෂණයට අදාළ කරුණු ඒ තුළින් උකහාගැනීම, අගතිගාමී නොවී මූලාශ්‍රගත තොරතුරු විචාරාත්මකව පරිශීලනය කිරීම යනාදී කරුණු උදාහරණ සහිතව අධ්‍යයනයට ලක්කොට තිබේ. මෙම සියලු කරුණු මගින් තහවුරු වනුයේ මානව දැනුම වර්ධනය කිරීමේ ක්‍රියාවලියේ දී ඓතිහාසික පර්යේෂණ ක්‍රමය සාධනීය මැදිහත් වීමක් සිදුකරන බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරවංශ හිමි, කොත්මලේ (1969). **ලක්දිව සෙල්ලිපි**, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

කා, එඩ්වඩ් හැලට් (1973). **ඉතිහාසය යනු කුමක් ද?** What is History, පරි. චරිතා විජේරත්න, මරදාන: සී/ස කුලරත්න සහ සමාගම.

ගම්ලත්, සුචරිත (2008). **ඉංග්‍රිසි සිංහල මහා ශබ්ද කෝෂය.** නුගේගොඩ: සංහිඳ මුද්‍රණ හා ප්‍රකාශන.

ජයසූරිය, චන්ද්‍රා (2017). **අධ්‍යාපන පර්යේෂණ ක්‍රම ශිල්ප.** කොට්ටාව: සාර ප්‍රකාශන.

රායි, හේමචන්ද්‍ර (1972). **ලංකා විශ්වවිද්‍යාල ඉතිහාසය 2 කාණ්ඩය.** කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

ලියනගේ, ආර්. පී. (1996). **අධ්‍යාපන පර්යේෂණ ක්‍රම ශිල්ප.** (සංස්.) අධ්‍යාපන පර්යේෂණ සඳහා යොමුකිරීමක්. මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

සේනාධීර, සිල්වි සහ වනසිංහ, ශාමින්ද (2013). **පර්යේෂණ ක්‍රමවේදය.** කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Best, J. W. & Kahn, J. V. (1993). **Reserchin Education**. Boston: Allyn & Becon.Elton,G.R.(1967). The Practice of History. Glasgow:William Collins sons & Co.ltd,

Kaestle, J. P. (1990). **Reserch Methodhodology**: Historical Methos in Educational Research Methodology and Measurement: An International Hand Book. (ed.) Keeves, .P. Oxford, Pergamon Press.

Koul, L. (1993). **Methodology of Educational Research**. New Dilhi: VikasPublishing House.

Srivasthava,P.G.N. (1994) **Advanced Research Methodology**. New Dilhi: Radha Publications.

http://www/bu.edu/historic/hs/index.html, 03/07/20`19.

https://www.``dictonary.com, 03/07/2019.

https://www.historyonthenet.com , 02/07/2019.